කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

අධ්‍යාපන පීඨය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාව

පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2021/2022

CPE 804 - තුලනාත්මක අධ්‍යාපනය

කාලය පැය දෙකයි (02)

**ඕනෑම ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. (i) තුලනාත්මක අධ්‍යාපනයේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

   (ii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලී සිටින්නෙකුට තුලනාත්මක අධ්‍යාපනය පිළිබඳ සුවිශේෂී දැනුමක් අවශ්‍ය වන්නේ කුමන හේතූන් නිසා ද යන්න තාර්කිකව විස්තර කරන්න. (ලකුණු 13)

2. (i) අතීත පිරිවෙන් අධ්‍යාපනයේ විශිෂ්ටත්වය නිදර්ශන සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

   (ii) "අතීතයේ පන්සල් පාසලේ ක්‍රියාත්මක වූ ද්විතියික අධ්‍යාපනය හා පවුල ආශ්‍රිතව ක්‍රියාත්මක වූ ද්විතියික අධ්‍යාපනය වර්තමාන සමාජ ආර්ථික ගැටලු සඳහා විසඳුමක් විය හැකිය." මෙම ප්‍රකාශය විමසුමට ලක්කරන්න. (ලකුණු 13)

3. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා ආර්ථිකය අතර පවතින නොගැලපීම නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

   (ii) සංවර්ධිත රටවල අධ්‍යාපනයේ නව ප්‍රවනතා පැහැදිලි කරන්න. (ලකුණු 13)

4. (i) වර්තමාන ලෝකයේ අධ්‍යාපන පද්ධතිය තුළ බහු සංස්කෘතික අධ්‍යාපනයක අවශ්‍යතාව විස්තර කරන්න. (ලකුණු 12)

(ii) ශ්‍රී ලාංකීය වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාවට නංවා ඇති බහු සංස්කෘතික ප්‍රයත්නයන් පැහැදිලි කරන්න.
(ලකුණු 13)

5. (i) 1930 දශකය මැද භාගය වන විට විලියම් බෙවරිජ් විසින් බ්‍රිතාන්‍ය සමාජය තුළ හඳුනාගත් යෝධ සමාජ ව්‍යසන පහ කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 12)

(ii) අනතුරුව 1944 දී බ්‍රිතාන්‍ය අධ්‍යාපන පද්ධතිය ප්‍රතිසංස්කරණය සඳහා ඉදිරිපත් කළ යෝජනා පිළිබඳ විවරණයක් ඉදිරිපත් කරන්න.
(ලකුණු 13)

6. (i) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දැකිය හැකි ප්‍රධාන ගැටලු පිළිබඳව විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 12)

(ii) මෙකී ගැටලූ අවම කර ගැනීම සඳහා ඔබ අධ්‍යයනය කර ඇති රටවල් කිහිපයකින් ගත හැකි ආදර්ශ මොනවාදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 13)